# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2338/19 – 2023 ජුනි මස 27 වැනි අඟහරුවාදා – 2023.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/241.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ඩී. ප්‍රියන්ජිත් මයා, අංක 65/1, කුමුදු මාවත, පිළියන්දල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, හිග්ගොල්ල පාර, පළමු පටුමඟ, 34/64 හි ඒ. බී. හේරත් මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුනි මස 22 වැනි දින,
කොළඹ දීය.

1A – G 039773 – 14 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2020/241.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ඩී. ප්‍රියන්ජිත් මයා, අංක 65/1, කුමුදු මාවත, පිළියන්දල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

'' කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ II ශ්‍රේණියේ අභ්‍යන්තර විගණක නිලධාරියෙකු ලෙස සේවය කරන ඩී. ඩී. ප්‍රියන්ජිත් මහතාට ආයතනයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා වන උසස්වීමට හිමිකමක් තිබේ ද එසේ හිමිකමක් තිබේ නම් එම තනතුර නොලැබීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදු ව තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 19 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 - 0206

---

මගේ අංකය: IR/COM/01/2021/05.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. ඒ. ලහිරු රංගන සඳනුවන් මහතා, අංක 24, ජාතික නිවාස සංකීර්ණය, කොටුවේගෙදර, මාතලේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

MBSL රක්ෂණ සමාගම, අංක 519, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, බුද්ධාලෝක පාර, අංක. 40 හි කේ. ඒ. තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුනි මස 22 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/01/2021/05.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. ඒ. ලහිරු රංගන සඳනුවන් මහතා, අංක 24, ජාතික නිවාස සංකීර්ණය, කොටුවේගෙදර, මාතලේ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

MBSL රක්ෂණ සමාගම, අංක 519, ටී. බී. ජයා මාවත, කොළඹ 10..

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ –**

'' 2012.09.21 දිනෙන් ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක නිලධාරියෙකු ලෙස MBSL රක්ෂණ සමාගමේ සේවයට බඳවා ගෙන ඇති යූ. ඒ. ලහිරු රංගන සඳනුවන් මහතාට,

- රැකියාවට බැඳුණු අවස්ථාවේ දී පැවති මූලික වැටුප, සියලු දීමනා හා නිලය, සේවා ගිවිසුම අවලංගු කිරීමක් නොකොට නව ගිවිසුමකට එළඹීමට පෙර 2015 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ අළෙවි විධායක නිලධාරියෙකු සඳහා ලබා දෙන වැටුප, සියලු දීමනාවන් හා වරප්‍රසාදයන් ලබා නොදීම.
- 2012.09.21 දින සිට සේවය කළ ද මේ වන තෙක් සේවය ස්ථිර නොකිරීම,

මගින් අසාධාරණයන් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 19 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 06 - 0205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.